# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## ඉතිහාසය

## 6 ශ්‍රේණිය

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

කාලය - පැය 2 යි

නම : ............................................................ පන්තිය : ......................

I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය කාලය කොපමණ ද?

   (i) අවුරුදු 50 කි. (ii) අවුරුදු 30 කි.

   (iii) අවුරුදු 70 කි. (iv) අවුරුදු 60 කි.

2. ශ්‍රී ලංකාවට බුදු දහම ගෙන ආවේ බුදුන්වහන්සේ පිරිනිවන් පා කොපමණ කාලයකට පසු ද?

   (i) අවුරුදු 237 (ii) අවුරුදු 273.

   (iii) අවුරුදු 200 (iv) අවුරුදු 327

3. බුදුන්වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන්කොට සාදා ඇති ස්තූපය කුමක් ද?

   (i) රුවන්වැලි සෑය (ii) ථූපාරාමය

   (iii) මිරිසවැටිය (iv) කිරිවෙහෙර

4. සංඝමිත්තා තෙරණිය ශ්‍රී ලංකාවට ගොඩබැසූ වරාය කුමක් ද?

   (i) මහාතිත්ථ (ii) යාපා පටුන

   (iii) දඹකොළ පටුන (iv) ගෝකණ්ණ

5. දේවානම් පියතිස්ස රජතුමා ලංකාවේ රජකම් කරන අවදියේ ඉන්දියාවේ සිටි රජතුමා කවුරුන් ද?

   (i) කණිෂ්ක රජතුමා (ii) කාවන්තිස්ස රජතුමා

   (iii) අශෝක රජතුමා (iv) විජය රජතුමා

6. දඩයම් යුගයේ මිනිසා ලද ලොකුම ජයග්‍රහණය මින් කුමක් ද?

   (i) ගොවිතැන් කිරීම. (ii) ස්ථිර වාසස්ථාන පිහිටවීම.

   (iii) රෝදය සොයා ගැනීම. (iv) ගින්දර සොයා ගැනීම.

7. ලංකාවට වරින් වර ආ ආර්ය කණ්ඩායමක් නොවන්නේ මින් කවුරුන් ද?

(i) විජය රජතුමා ඇතුළු පිරිස. (ii) පාණ්ඩුවාසුදේව ඇතුළු පිරිස.

(iii) භද්දකච්චායනා ඇතුළු පිරිස. (iv) කාලිංස මාඝ ඇතුළු පිරිස.

8. පුරාණ අතීතයේ ලංකාවේ සිටි ජන වර්ගයක් වන යක්ෂ ගෝත්‍රයේ ප්‍රධාන ජනාවාසය පිහිටා තිබූ නගරය කමක් ද?

(i) සිරිසවත්ථුපුරය. (ii) මහියංගනය.

(iii) නාගදීපය. (iv) භග්ගල.

9. මිනිසා ම්ලේච්ඡ සමාජයෙන් ශිෂ්ඨ සමාජයකට පිවිසීම සිදුවූයේ මින් කුමන යුගයේදී ද?

(i) එඬේර යුගය. (ii) ගොවි යුගය.

(iii) දඩයම් යුගය. (iv) නූතන යුගය.

10. ඉතිහාසයේ පියා ලෙස හඳුන්වන්නේ මින් කවුරුන් ද?

(i) ඩයිඩෝරීස් (ii) පොලිබියස්

(iii) හිපොක්‍රටීස් (iv) හෙරඩෝටස්

- සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

11. මිහිඳු හිමි දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු පිරිසට දේශනා කරන ලද්දේ ........................................ සූත්‍රයෙනි.

12. ශ්‍රී ලංකාවේ බුද්ධදහම පතුරුවා ලීමට මූලික වූයේ ........................................ යි.

13. භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිස ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ........................................ තොටුපලෙන් නැවු නැග ගෝකණ්ණ වරාය වෙත පැමිණියහ.

14. කාවන්තිස්ස රජ සමයේ රුහුණු රටේ බලවත්ම රාජ්‍ය වූයේ ........................................ යි.

15. මධ්‍යම ආසියාවේ සිටි ආර්ය ජනයා ........................................ කඳුවැටිය හරහා ඉන්දියාවට ළඟා වී ඇත.

(මාගම, අනුරාධපුරය, මහා විහාරය, ථූපාරාමය, හින්දුකුෂ්, චූල්ලහත්ථි පදෝපම, සුප්පාරක, තාමුලිප්ති)

• 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සිතියම ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




16. රෝහණ රාජ්‍යයට අයත් සේරු නුවර දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද? ..........................

17. දුටුගැමුණු රජතුමා මුල්වරට සොළීන් සමග සටන් කිරීම සිදුවූ මහියංගනය දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........................

18. සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධිය රැගෙන ගොඩ බැසූ පැරණි වරාය වන දඹකොළපටුන දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........................

19. උරුවේල ඇමති විසින් පිහිටවූ ජනාවාසයක් වන උරුවේල ග්‍රාම දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද? ..........................

20. සද්ධාතිස්ස කුමරුට සංවර්ධනය කිරීම සඳහා පවරා දුන් දීඝවාපි ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........................

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

(1) ඔබ පන්තියේදී දේවානම්පියතිස්ස රජු පිළිබඳව ලියා සකස් කළ පොත අනුසාරයෙන් පිළිතුරු සපයන්න.

(i) ඔබගේ කණ්ඩායම සකස් වූයේ කෙසේ ද? ................................................ (ල - 2)

(ii) ඔබ කණ්ඩායමට පැවරුනේ රජතුමා පිළිබඳව කුමන කරුණු ඉදිරිපත් කිරීමට ද?
................................................ (ල - 2)

(iii) එම රජතුමා පිළිබඳව ඔබ විසින් ලියන ලද ප්‍රධාන කරුණු 4 ක් ලියන්න.
................................................
................................................
................................................
................................................ (ල - 4)

(iv) එම පොත සකස්කළ ආකාරය පිළිබඳව කරුණු 4 ක් ලියන්න.
................................................
................................................
................................................
................................................ (ල - 4)

(v) එම පොත සකස් කිරීමෙන් ඔබට ලැබුණ ප්‍රයෝජන 2 ක් ලියන්න.
................................................
................................................ (ල - 4)

(2) (i) ශ්‍රී ලංකාවට ආ ආර්ය කණ්ඩායම් 2 ක් නම් කරන්න.

(i) ................................................

(ii) ................................................

(ii) විජය රජතුමා ඇතුලු පිරිස ලංකාවට එනවිට ලංකාවේ සිටි ප්‍රධාන ජන වර්ග දෙක සහ ඔවුන්ගේ ප්‍රධාන රාජධානි පැවති නගරය නම් කරන්න.

| ජනවර්ගය | ප්‍රධාන නගරය |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |

(iii) පහත සඳහන් වන ගංගා අසල පිහිටුවාගත් පැරණි ජනාවාස දැක්වෙන අක්ෂරය වරහන තුල ලියන්න.

| | | |
|---|---|---|
| ★ මල්වතු ඔය අසල | ( ) | (අ) උපතිස්සගාම |
| ★ කලා ඔය මෝය අසල | ( ) | (ආ) අනුරාධගාම |
| ★ කනදරා ඔය අසල | ( ) | (ඇ) උරුවේලගාම |
| ★ මැණික් ගඟ අසල | ( ) | (ඉ) මහාගාම |
| ★ කිරිඳි ඔය අසල | ( ) | (ඊ) කාවරගාම |

(ල - 11)

(3) (i) විජය රජ තුමා සහ පඬුවස්දෙව් රජතුමා තම අගනුවර ලෙස භාවිතා කළේ කුමන නගරය ද?

..............................................................

(ii) පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය කාලයේ පැවති ප්‍රධාන ජීවනෝපාය ක්‍රම 4 ක් ලියන්න.

.............................................................. ..............................................................

.............................................................. ..............................................................

(iii) අනුරාධපුරය සැලසුම් සහගත නගරයක් ලෙස සකස් කිරීමට පණ්ඩුකාභය රජතුමා ගත් ක්‍රියාමාර්ග 5 ක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(4) (i) පුරාණයේ ඉන්දියාව හැඳින්වූ නම් දෙකක් ලියන්න.

.............................................................. ..............................................................

(ii) (අ) අෂ්ඨඵලරුහ බෝධි නමින් හඳුන්වන්නේ මොනවා ද?

..............................................................................................................................

(ආ) අෂ්ඨඵලරුහ බෝධි රෝපණය කළ ස්ථාන 2 ක් ලියන්න.

.............................................................. ..............................................................

(iii) දේවානම් පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලයේ එතුමා විසින් කරවන ලද වෙහෙර විහාර 4 ක් ලියන්න. ඉන් එකක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

.............................................................. ..............................................................

.............................................................. ..............................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ල - 11)

(5) (i) ලංකාවට බුදු දහම ලැබීම නිසා අධ්‍යාපනික අංශයෙහි ඇතිවූ දියුණුව පිළිබඳව කරුණු දෙකක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

(ii) බුදු දහම ලැබීම නිසා ලාංකික සමාජයේ පැවති සිරිත් විරිත්වල දියුණුවක් ඇතිවූ බව සනාථ කිරීමට කරුණු දෙකක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

(iii) අදාළ පිළිතුර ඉදිරියෙන් ලියන්න.

★ ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ රජතුමා ..............................................................

★ මහමෙව්නා උයන සෑදවීම ..............................................................

★ ප්‍රථම ශ්‍රී ලාංකික භික්ෂුණිය ..............................................................

★ මිරිසවැටිය දාගැබ සෑදීම ..............................................................

★ බසවක්කුලම වැව සෑදීම ..............................................................

★ රෝහණ රාජ්‍යයේ පළමු පාලකයා ..............................................................

(ල - 11)

(6) (i) එළාර රජතුමා ලංකාව ආක්‍රමණය කරන විට අනුරාධපුරයේ රජකළ රජතුමා කවුද?

..............................................................

(ii) රෝහණ රාජ්‍යයට අයත්ව තිබූ වෙනත් සුළු රාජ්‍ය 4 ක් නම් කරන්න.

.............................................. ..............................................

.............................................. ..............................................

(iii) කාවන්තිස්ස රජතුමා තම පුතු දුටු ගැමුණු කුමරුට අනාගතයේ රට මුදාගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසා දුන් අති ශ්‍රේෂ්ඨ රජ කෙනෙකු ලෙස හැඳින්විය හැක. ඒ සඳහා කාවන්තිස්ස රජතුමා කරන ලද කාර්යයන් 5 ක් ලියන්න.

..............................................................

..............................................................

..............................................................

..............................................................

..............................................................

(ල - 11)

(7) (i) දුටු ගැමුණු රජතුමාගේ සේනාවේ සිටි දස මහ යෝධයින් 4 දෙනෙකු නම් කරන්න.

.............................................. ..............................................

.............................................. ..............................................

(ii) දුටු ගැමුණු රජතුමා විසින් එළාර රජතුමා සමඟ අවසන් සටන සිදුකිරීමට ප්‍රථම යටත් කරගත් බලකොටු 4 ලියන්න.

.............................................. ..............................................

.............................................. ..............................................

(iii) දුටු ගැමුණු රජතුමාගෙන් සිදුවූ ආර්ථික සේවාවන් 2 ක් ලියන්න.

..............................................................

..............................................................

(iv) බුද්ධ ශාසනයේ දියුණුවට දුටු ගැමුණු රජ කළ සේවාවන් 3 ක් ලියන්න.

..............................................................

..............................................................

..............................................................

(ල - 11)